අඹගමුව ප්‍රාදේශීය සභාව

නුවරඑළිය දිස්ත්‍රික්කය

-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 15 දින ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට අඹගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ). මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු අත්කරත්ත ප්‍රමාණය 85 ක් වූ අතර, ඒවායේ වටිනාකම රු.786,970 ක් විය. එහෙත් එදිනට සභාවට අයත් තථ්‍ය අත්කරත්ත ප්‍රමාණය 29 ක් වූ අතර, ඒවායේ වටිනාකම ගණනය කර නොතිබුණි.

(ආ). අක්කර 11 රූඩ් 2 ක් වපසරිය වූ ඉඩම් කැබලි 7 ක වටිනාකම රු.34,000 ක් ලෙසට ඉතා අඩු අගයක් දක්වා තිබුණු බැවින් ඉඩම්වල සාධාරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ). මූල්‍ය ප්‍රකාශනවල රු.17,000 ක වටිනාකමට ඇතුලත් කර තිබුණු අක්කර 2 ක් වූ ගම්සභා කාර්යාල ඉඩමෙන් රූඩ් 1 පර්චස් 33 ක් රු.3,500,000 කට ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට විකුණා තිබුණද, අදාල මුළු ඉඩමම සභාවට අයිති ලෙසට සලකා ගිණුම්ගතකර තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.640,390ක් වූ ණයගැතියන් ද්විගණනයවී තිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට රු.117,617 ක අගරු වී තිබුණු චෙක්පත් වෙනුවෙන් මුදල් ලැබී තිබුණද, එම අගරු චෙක්පත්වල වටිනාකම අයවිය යුතු මුදල් යටතේ ශේෂ පත්‍රයේ දක්වා තිබුණි.

1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
---------------------------------------

(අ). ලැබිය යුතු ගිණුම්
--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 3 සිට වසර 9 දක්වා කාල පරාසයක් ගතවී ඇති ලැබිය යුතු ගිණුම් ශේෂ 2 ක එකතුව වූ රු.925,474 ක් විය.

(ආ). ගෙවිය යුතු ගිණුම්
--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකළ මාස 1 සිට වසර 5 දක්වා කාල පරාසයක් ගතවී ඇති තැන්පතු ශේෂ 2 ක වටිනාකම රු.6,499,033ක් විය.

1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම.
------------------------------------------------------

උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා රු.638,021ක් වූ ණයහිමියන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,910,676 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,479,851 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,569,175 ක පහත වැටීමක් දක්නට ලැබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-------------------------------------

මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,569,175 ක පහත වැටීමට ප්‍රධාන වශයෙන් ආදායම් විෂයන් 3 ක ආදායම අඩුවීමද, වියදම් විෂයන් 4 ක වියදම් වැඩිවීමද ඇතුළුව අනෙකුත් ආදායම් හා වියදම් විෂයයන්වල වෙනස්වීම් බලපා තිබුණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

-------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින ජංගම වත්කම් සමග ජංගම වගකීම් සැසඳීමේදී, ජංගම අනුපාතය: 0.9:1 ක් ලෙසට දුර්වල මට්ටමක පැවතුණි. එමෙන්ම ජංගම වත්කම් ප්‍රමාණය වූ රු.107,167,092 න් රු.73,623,239 ක් කර්මාන්ත ණයගැතියන් වූයෙන් ජංගම වත්කම් වලින් සියයට 68 ක් කර්මාන්ත ණයගැතියන් වූ අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය රු.437,547 ක ඍණ අගයක් විය.

2.4. ආදායම් පරිපාලනය

-----------------------

සභාවේ ලේකම්වරයා විසින් ඉදිරිපත් කර තිබුණු ආදායම් පිළිබඳ තොරතුරු අනුව රු.3,515,483ක හිඟ ආදායම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකර නොතිබුණි.

2.4.1 වෙනත් ආදායම්.

------------------

(අ). සභා බල ප්‍රදේශය තුළ ආදායම් අයකර ගත හැකි පහත සඳහන් ව්‍යාපාර සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(i). වාහන නැවතුම්පල.

(ii). පෞද්ගලික දුරකථන, ගුවන්විදුලි හා රූපවාහිණි සම්ප්‍රේෂණ කුළුණු.

(iii). කුඩා ප්‍රමාණයේ විදුලි බලාගාර.

(iv). වෙළඳ ප්‍රචාරණ දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම.

(ආ). පොදු වැසිකිලිය බදු දීම.

සභාවට අයත් පොදු වැසිකිලිය 2016 වර්ෂයට බදුදීමට අදාළව 2015 නොවැම්බර් 23 දින අත්සන් කර තිබුණු ගිවිසුම අනුව ටෙන්ඩර් වටිනාකම වූ රු.600,000 න් රු.300,000 ක් එදිනද, ඉතිරි රු.300,000 2016 ජූනි 30 දින හෝ ඊට පෙර අයවිය යුතු වුවද, ගිවිසුම අත්සන් කර තිබුණු 2015 නොවැම්බර් 23 දින කිසිදු මුදලක් අයවී නොතිබුණි. 2016 පෙබරවාරි 12 දින රු.30,000 ක් පමණක් ලැබී තිබුණු අතර, ඉන්පසු 2016 ජූනි 30 දින තෙක් කිසිදු මුදලක් ලැබී නොතිබුණි. පසුව අවස්ථා 4 කදී රු.340,000 ක් ලැබී තිබුණු අතර, ඉතිරි රු.230,000 ක හිඟ මුදල 2017 ජනවාරි 10 දින වන විටද ලැබී නොතිබුණි.

2.4.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය උසාවි දඩ රු.3,501,524 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය.

3.1. කළමනාකරණ අකාර්යක්ෂමතා.

(අ). පාවිච්චි කර අවසන් උපපත්‍රිකා පොත් 123 ක් ආපසු භාර නොගෙන නව උපපත්‍රිකා පොත් නිකුත් කර තිබුණි.

(ආ). සභාව සතු කිරිවන්එළිය ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයේ වහලය, ගෙබිම හා දොරවල් ආදිය කැඩී ඉතාමත් අබලන් තත්ත්වයේ පැවති අතර ප්‍රමාණවත් පරිදි විදුලිය පහසුකම් සපයා නොතිබුණි. එමෙන්ම ගබඩා පහසුකම් නොතිබීම නිසා ඖෂධ අවිධිමත් ලෙස ගබඩාකර තිබුණි. තවද ආයුර්වේද වෛද්‍ය නිලධාරි නිවාසය අබලන්ව පැවති අතර එයට වැසිකිළි සහ විදුලිය පහසුකම් සලසා නොතිබුණි.

(ඇ). මුදල් රෙගුලාසි 387 ප්‍රකාරව රජයේ ගිණුම්වල බැංකු අයිරා ඇතිවන ආකාරයට ගෙවීම් නොකළ යුතු වුවත් බැංකු ගිණුම් දෙකකට අදාළව මුදල් පොත්වල ඍණ ශේෂ ඇතිවන ලෙස චෙක්පත් ලියා තිබුණි.

3.2. මෙහෙයුම් අකාර්යක්ෂමතා.

--------------------------------

2015 වර්ෂයට ආදාළ භාණ්ඩ සමීක්ෂණයේදී සභාවට අයත් පුස්තකාල 10 ක රු.228,023 ක් වටිනා පොත් 1929 ක් අස්ථානගත වූ බව හඳුනාගෙන තිබුණද, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.

-------------------------------------------

සභාවට අයත් මෝටර් කාර් රථයක් සහ යතුරුපැදි 2 ක් අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීම හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් හෝ නොගෙන වසර 1 සිට වසර 2 අතර කාල පරාසයක් ධාවනයෙන් ඉවත් කර තිබුණි.

3.4 හඳුනාගත් අලාභ

--------------------

සභාව සතු රු.103,400 ක් වටිනා සාමාන්‍ය කැමරාවක් සහ වීඩියෝ කැමරාවක් අස්ථානගතවී තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.5 කොන්ත්‍රාත් පරිපාලනය.

----------------------------

(අ). පළාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන උපයෝගී කරගෙන ඉදිකරන ලද පෙර පාසැලක ඇලුමිනියම් දොරවල් සහ ජනෙල් සවිකිරීමේදී නොකරන ලද වැඩ වෙනුවෙන් රු.24,584 ක් ගෙවා තිබුණි. තවද මෙම පෙර පාසැලේ ජල අවශ්‍යතා සඳහා ලීටර් 1000 ජල ටැංකියක් සවිකිරීම වෙනුවෙන් රු.29,126 ක් ගෙවා තිබුණද ලීටර 500ක ජල ටැංකියක් සවිකර තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනයේ ඇතුළත් කර තිබුණු රු.268,781,961 ක් වූ ප්‍රාග්ධන වැය ව්‍යාපෘති 19 ක් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

3.6 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.

-----------------------------------

සභා බලප්‍රදේශය තුළ එක්රැස් කරනු ලබන ඝන අපද්‍රව්‍ය, කළමනාකරණය සඳහා පවත්වාගෙන ගොස් තිබුණු පෙරසැරි ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ). නිෂ්පාදනය කරන ලද කොම්පොස්ට් පොහොර කි.ග්‍රෑ 7000 ක් පමණ වසරකට අධික කාලයක් ගබඩාකර තිබුණු අතර, ඒවා අලෙවිකිරීමට විධිමත් වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණි. මේ හේතුවෙන් අළුතින් නිපදවන පොහොර ගබඩා කිරීමට ඉඩ පහසුකම් ඇහිරීගොස් තිබුණු අතර, පොහොරවල සක්‍රීය භාවය උදාසීන වීමටද හේතුවී තිබුණි.

(ආ). ඝන අපද්‍රව්‍ය පෙරසැරි කිරීම සඳහා යොදා ගන්නා යන්ත්‍රයේ දැල දිරාපත්වී තිබුණු බැවින් මාස 7 ක පමණ කාලයක් යන්ත්‍රය භාවිතයෙන් ඉවත්කර තිබුණි.

(ඇ). ඝන අපද්‍රව්‍යවල අඩංගු පොලිතීන් විධිමත් ආකාරයකට පෙරසැරි කිරීමකින් තොරව පෙරසැරි මධ්‍යස්ථානය අසල භූමියේ පස් දමා වසා තිබුණු අතර, ඇතැම් පොලිතීන් කොටස් භූමිය මත විසිරී තිබුණි.

(ඈ). භාවිතයෙන් ඉවත්කරන ලද විවිධ වර්ගවල හිස් බෝතල් විශාල ප්‍රමාණයක් මධ්‍යස්ථාන භූමියේ රැස්කර තිබුණි.

(ඉ). මධ්‍යස්ථානයේ කටයුතු විධිමත්ව පවත්වාගෙන යෑම සඳහා ප්‍රමාණවත් කම්කරුවන් සංඛ්‍යාවක් යොදවා නොතිබුණි.

3.7 පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම.

2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ බලපවත්වන ලද රෙගුලාසිවලට අනුකූලව 2008 ජනවාරි 25 දිනැති අංක 1533/දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව බලපත්‍ර අලුත් කළ යුතු ව්‍යාපාර 9 කට නව බලපත්‍ර නිකුත්කර නොතිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

අයවැය පාලනය.

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 6 ක සියයට 7 සිට සියයට 51 දක්වාද වියදම් විෂයයන් 6 ක සියයට 19 සිට සියයට 77 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලනය.

-----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|---|
| (අ). | ආදායම් පරිපාලනය. | සභාවට ලැබිය යුතු හිඟ ආදායම් අයකරගෙන නොතිබීම. |
| (ආ). | ණයගැති/ ණයහිමි පාලනය. | සභාවට ලැබිය යුතු මුදල් නිරවුල්කර නොගැනීම සහ සභාව විසින් ගෙවිය යුතු මුදල් නිරවුල් කර නොතිබීම. |
| (ඇ). | වත්කම් පාලනය. | සභාවට අයත් වත්කම් මනාව නඩත්තුකර නොතිබීම සහ ආරක්ෂා කිරීමට කටයුතු නොකිරීම. |
| (ඇ). | ගිණුම්කරණය. | ගිණුම් වර්ෂයට අදාළ වත්කම් සහ බැරකම් ගිණුම්ගත කිරීමේදී විවිධ අඩුපාඩු සිදුවී තිබීම. |